**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ වටිනාකම රු.457,500 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කළ බව දන්වා ඇත. |
| (ආ) | කැබ් රථයේ වටිනාකම රු.160,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරන බව දන්වා ඇත. |

#### 1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂ හා උපයෝගී ලේඛන අතර රු.65,199 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් සිදු කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | <u>ලැබිය යුතු ගිණුම්</u><br>අවුරුදු 05 ක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.105,114 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර හිඟ ශේෂය රු.1,065,015 ක් විය. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ශේෂයෙන් කොටසක් ලැබී ඇති අතර, ඉතිරි මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

| | | |
|---|---|---|
| අවුරුදු 05 ක් ඉක්ම වූ ගෙවිය යුතු ශේෂවල එකතුව රු.82,142 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර හිඟ ශේෂය රු.1,826,348 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුවේ. | කොටසක් නිරවුල් කර ඇති අතර, ඉදිරියේ දී ශේෂය ගෙවා දැමීමට කටයුතු කරමි. |

**1.3.4** <u>**විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම තොරතුරු ඉදිරිපත් නොකිරීම**</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.77,122,268 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි අයිතම 03 ක් සඳහා ඔප්පු හා පැවරුම් නියෝග විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

**1.3.5** <u>**අනුකූල නොවීම**</u>

**1.3.5.1** <u>**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**</u>

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| | 218 වගන්තිය | ඉඩම් හා ගොඩනැගිලිවලට අදාළව සමීක්ෂණයක් පවත්වා පරීක්ෂණ වාර්තා පිළියෙල කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සමීක්ෂණය සිදු වන බැවින්, අවසන් වූ පසු වාර්තා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මු.රෙ. 571(02) | වර්ෂ 02 ක ඉක්ම වූ රු.5,403,582 ක් වටිනා තැන්පතු රජයේ ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | අදාළ පාර්ශව දැනුවත් කර, ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,688,111 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,466,363 ක් විය.

## 2.2 <u>ආදායම් පරිපාලනය</u>

### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,276,000 | 3,200,819 | 2,928,850 | 993,625 | 2,136,000 | 2,330,256 | 2,431,826 | 1,422,113 |
| (ii) | කුලී | 6,172,000 | 7,492,886 | 7,032,537 | 723,390 | 5,419,000 | 4,467,906 | 4,530,665 | 512,524 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 785,200 | 1,013,141 | 1,128,859 | 560,700 | 1,220,200 | 1,324,116 | 1,326,912 | 351,200 |
| (iv) | වෙනත් ආදායම් | 65,956,815 | 57,920,030 | 46,089,542 | 15,441,695 | 57,029,965 | 48,126,720 | 35,348,790 | 27,637,147 |
| | එකතුව | 75,190,015 | 69,626,876 | 57,179,790 | 17,719,410 | 65,805,165 | 56,248,998 | 43,638,193 | 29,922,986 |

### 2.2.2 <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වරිපනම් | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.861,731 ක මුදලක් අය කර නොතිබුණි. | වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරමි. |
| (ආ) අක්කර බදු | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.92,723 ක අක්කර බදු ආදායමක් අය කර නොතිබුණි. | හිඟ අක්කර බදු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | අක්කර බදුහිමියන් සොයාගත නොහැකි බැවින්, අය කිරීම ගැටළු සහගත බව දන්වා ඇත. |

### 2.2.3 <u>කුලී</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කඩ කුලි | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.631,994 ක ආදායමක් අය කර නොතිබුණි. | හිඟ කඩ කුලි අය කළ යුතුවේ. | ඉදිරියේ දී අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. |

**2.2.4** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.681,332 ක් හා මුද්දර ගාස්තු රු.12,745,386 ක් විය. | ලැබිය යුතු උසාවි දඩ ලබා ගත යුතු වේ. | අදාළ ආයතන දැනුවත් කර, කඩිනමින් අය කිරීමට කටයුතු කරමි. |

**3.** <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

**3.1** <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දී, රු.2,665,440 ක වියදමක් දරා කසළ ප්‍රතිචක්‍රීයකරණ ගොඩනැගිල්ලක් ඉදිකර ඇතත්, ප්‍රතිචක්‍රීයකරණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | වත්කම්වලින් ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 ජනවාරි මාසයේ ප්‍රතිචක්‍රීයකරණ කටයුතු ආරම්භ කළ බව දන්වමි. |

(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් බල ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් විවිධ වූ කාර්යයන් ක්‍රියාත්මක කරන නමුත්, ඒවා තිරසර සංවර්ධන ඉලක්ක සමඟ කෙසේ ගැළපේ ද, යන්න පිළිබඳ ඇගයීමක් හා පසු විපරම් ක්‍රියාවලියක් සිදු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ පසු විපරම් කළ යුතුවේ. | ඉදිරියේ පසු විපරම් ක්‍රියාවලිය හා වාර්තා සැකසීමට කටයුතු කරමි. |

**3.2** <u>**කළමනාකරණ අකාර්යක්ෂමතා**</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බාහිර ආයතන සමඟ ගිවිසුම්ගත වීමේ දී, දෙපාර්ශවයේ එකඟතාවය මත ගිවිසුමකට එළඹිය යුතු වුවත්, පරිගණක මෘදුකාංගය මිලදී ගැනීමේ දී, තෝරා ගත් ආයතනය | බාහිර පාර්ශව සමඟ ගිවිසුම්ගතවීම් විධිමත් පරිදි කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නව ගිවිසුමකට එළඹීමට කටයුතු කරමි. |

සකස් කළ ගිවිසුමකට සභාපති සහ ලේකම් 2014 අගෝස්තු 22 දින අත්සන් තබා තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු 06 ක් පැවතුණි. | අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගත යුතුවේ. | බඳවා ගැනීම සඳහා කටයුතු කරමි. |
| (ආ) | සේවක ණය | | |
| | ස්ථාන මාරු වූ නිලධාරිනියෙකුගෙන් අය විය යුතු රු.240,700 ක් වූ ණය ශේෂය අය කර නොතිබුණි. | ණය මුදල් අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අය කිරීමට කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බල ප්‍රදේශයේ පවතින ජල යෝජනා ක්‍රම 06 ක් අක්‍රීයව පැවතුණි. | ජල යෝජනා ක්‍රම මඟින් උපරිම ප්‍රයෝජන ගත යුතු වේ. | විෂය භාර ඇමතිට අදාළ තොරතුරු ඉදිරිපත් කර, ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නඩත්තු හා අලුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.7,915,750 ක් වූ වෙන්දේසි ඉඩම් කට්ටි 04 ක් ප්‍රජාවගේ අවශ්‍යතා වෙනුවෙන් සංවර්ධනය කර නොතිබුණි. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී සංවර්ධනය කිරීමට කටයුතු කරමි. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලේඛනගතව පවතින රු.75,235,788 ක වටිනාකමින් යුත් ස්ථාවර වත්කම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමීක්ෂණයකින් පසු පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) රු.10,556,354 ක් වැය කර ඉදිකළ ඇත්ගාල වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ස්ථාවර වත්කමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගත යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරන බව දන්වමි. |
| (ඇ) ඇත්ගාල හා කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණ පිහිටි ඉඩම් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පවරා ගැනීම සඳහා වූ ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. |

**3.5.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාව සතු රු.302,540 ක් වටිනා වාහන 03 ක් නිෂ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගත යුතුවේ. | වෙන්දේසි කිරීමට හා අදාළ අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ආ) රු.185,000 ක් වැය කර 2007 වර්ෂයේ මිලදී ගත් කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගත යුතුවේ. | වෙන්දේසි කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගනිමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 - 2.2.2(අ)(iii)<br>හිඟ වරිපනම් අය විය යුතු වරිපනම් ඒකක 117 ක් වර්තමානය වන විට හඳුනා ගෙන නොතිබුණි. | වරිපනම් ඒකක නිවැරදිව හඳුනාගත යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති අතර, ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. |

(ආ) 2018 - 3.2(ඇ)
------------------

| | | |
|---|---|---|
| සභාව බදු දී තිබූ ඉඩම් 10 ක බදු කුලිය 2007 වර්ෂයෙන් පසු ප්‍රතිශෝධනය කර නොතිබුණි. | බදු කුලි ප්‍රතිශෝධනය කාලානුරූපීව සිදු කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති නමුත්, ඔවුන් අදාළ ක්‍රියාමාර්ග නොගෙන ඇති බව දන්වා ඇත. |

(ඇ) 2018 - 3.2(ඈ)
-----------------

| | | |
|---|---|---|
| සභාව සතු ඇත්ගාල සති පොලෙන් ආදායමක් ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සති පොලෙන් ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී බදු දීමට කටයුතු කරමි. |